




සිසිර දිසානායක

# "සිනාවී" පසු වදන

පන්හිඳයි, පින්සලයි, පැන්සලයි තුන්දෙනා ''සිනා වී'' ප්‍රසංගය පලන්න ගිහින් ගෙදර ආවේ හරිම සතුටින්. ඒ ගැන කතා කරන්න අපේ කට්ටියට දේවල් ඕන තරම් තිබුණා.

''හැමොම කියන්නෙ හැම දෙයක්ම හොඳින් වුණායි'යලා තමයි'' පන්හඳගේ කතාවට කවුරුත් එකඟ වුණා.

''ඒත් අඩු පාඩුත් දැකලා පෙන්නලා දෙනවනම් ප්‍රසංගය සංවිධානය කරපු අයට වැදගත් වේවි.'' කවදත් හරස් අදහස් එකතු කරන පැන්සල කිව්වා.

''හැම දෙයක් ම හොඳින් වුණානම් ඉදිරියත් අනික් අයටත් මේ වාගේ දෙයක් මීටත් වැඩිය හොඳින් කරන්න පුළුවන් වෙන්නෙ ඒ අත්දැකීම බෙදා හදා ගත්තොත් නේද ? පින්සලක් හොඳ අදහසක් එකතු කළා.

''හොඳම වැඩේ සිසිර දිසානායක එක්ක සාකච්ඡාවක් කරන එක. උන්නැහේත් කැමති වේවි.'' පින් ගේ අදහසට පොහොර දැම්මා.

''මං ඒ වැඩේ බාර ගන්නං.'' පන් ටේප් රැකෝඩරෙත් මල්ලට දාගෙන ලක ලෑස්ති වුණේ උන්නැහේගේ ගෙදර යන්න වෙලාවකුත් කතා කරගෙන.

''මේ ප්‍රසංගයේ මූලික පරමාර්ථය වුණේ ''සිනාවී'' සංගත තැටිය එළි දක්වන එක. සංගත තැටියේ ගායනා කරපු සරිනිත් එක්ක ආපු එකඟතාවයක් තමයි තවත් එයාගේ වයසේ ගායන හැකියාව තියෙන තරුණ තරුණියන්ව කීප දෙනෙක් එකතු කර ගන්න එක.''

මුලින්ම කලේ පිටපතක් ලියන එක. පීප වතාවේ අඩු වැඩි කරමින් මේ පිටපත සංශෝධනය කරන්න වුණා. ඒ හැම දෙයක්ම සරිනිත් එක්ක කතා රමින් තමයි කළේ. මේ පිටපතේ හැටියට එක පිටුවකට සීමා වුණා සාරාංශයකුයි, සවිස්තර වැඩ සටහන ගොනු කරපු ''රනින් ෂීට්'' එකකුයි ඊ ළඟට හදා ගත්තා. ඒකෙ ශබ්ද පරිපාලය, ආලෝකකරණය, දර්ශන තල වාගේ දේවල් ඒ අදාල අයට ඇතුලත් කරගන්න ඉඩ තියලයි කළේ.

අපේ පිටපතයි මේ ''රනින් ෂීට්'' එකයි දිහා බලපුවාම ඒවා ක්‍රියාත්මක කරවා ගන් සුදුසු පරිසක් තෝරාගන්න එක තමයි වැදගත්ම කාරියණේ. මේ කටයුත්තෙදි කාරණා කීපයක් සැලකිල්ලට ගත්තා. මිට පෙර කිල් වතාවල අපිත් එක්ක වැඩ කරලා හුරු, සුහද, කැපවෙලා වැඩක් කරන්න කැමති අයට තමයි මුල් තැන දුන්නෙ.

වේදිකා පරිපාලනයට අපි ආරාධනා කලේ ජගත් කොතලාවල සහෝදරයාට. ජගත්ගේ සහයට රුචිත් ගුණරත්න සහෝදරයට කතා කළා. ඇත්තටම ''සහයට'' කියල කිව්වට ඔහුටත් දෙවෙනි වේදිකා පරිපාලකයෙකු විදියටයි කටයුතු කරන්න වුණේ. වේදිකාවේ සහයට පියත්, කුෂාන්, වෙනුරි, නාලිකා, පද්මා වගේ පිරිස් තිරෙන් පිටිපස්සෙට එකතු වුණා. ආලෝකය පාලනය කරන්න එකතු වුණේ සුපින් බණ්ඩාර සෙහොයුරාග තිරයෙ ප්‍රදර්ශනය කරන දෘෂ්‍ය සංකලන නිර්මාණය කරලා ඉදිරිපත් කළේ භානුක මනෝරත්න සොහොයුරා. ඒ අතරට චන්දිම ජයනෙත්ති සොහොයුරාගේ රූප රචනා දෙකකුත් එකතු වුණා. පූර්විකාව පසුබිම්න් කියවන් තෝරාගත්තෙත් චන්දිමවමයි. ඡායාරූපයෙන් ප්‍රසංගය ආවරණය කරන්න දුෂ් බුලත්සිංහල සොහොයුරාවත්, වීඩියෝ දර්ශන ගත කරන්න හර්ෂාන් මහවිතාන සොහොයුරාවත් එක් කර ගත්තා. මේ තමා වේදිකාවේ නොපෙනුන අපේ ''සිනාවී'' කට්ටිය.

මේ කට්ටියට වේදිකවෙදි එකතු වෙනවා මධුර සෙනෙවිරත්න සොහොයුරාත් නිමාෂිනී පැල්පොල දුවත්. ඒ ප්‍රසංගය ඉදිරිපත් කරන්න. ප්‍රසංගයේ



සංගීත මෙහෙයුමට එක්වෙන්නෙ ඉන්ද්‍රජිත් මිරිහාන තරුණ සංගීත වේදියා. ඉන්ද්‍රජිත් ශබ්ද පරිපාලනයටත් පුරුදු විදියටම එක් වෙනවා. ඩී.ඩී. ගුණසේන, තිලකා කුලතුංග, රංග වික්‍රමාරච්චි, ජූඩ් ෆර්නැන්ඩු, සුසන්ත කුමාරගේ, නීල් ගමගේ, කැමරන් කොළඹගේ, රෝහිත උඩුවෙල කියන වාදක මණ්ඩලයයි ඉන්ද්‍රජිත් මිරිහානට එක් වුණ අනික් කණ්ඩායම. මීට අමතරව බෙර වාදනයට රංගන් උදුම්බරා කණ්ඩායමේ රංගන රත්නතුංග, රශිකා කුලතුංග නර්තනාචාර්යවරියගේ විශ්ව රංගායතනයේ දරුවන් පිරිසකුත්, දිනේෂ් ඈපාසිංහ නර්තනාචාර්යවරායේ ''අභින'' නර්තන කණ්ඩායමත් ''සිනාවී'' කට්ටියට එකතු වුණා. ඔය අපේ ප්‍රසංගයට දායක වුණ කට්ටිය.

මීට අමතරව ප්‍රෙක්ෂකාගාර පරිපාලක වරයා විදියට මහේන්ද්‍ර කාලිංගමුදලි කියන අපේ පන්ති මිත්‍රයාව පත්කරගත්තා. මුල ඉඳන්ම හෙවනැල්ලක් වගේ හිටපු මහේන්ද්‍ර මගේ හිතවත් උපදේශකවරයා විදියටත් කටයුතු කළා. මහේන්ද්‍රට නන්දන ඇතුලත්මුදලි, අජිත් සිල්වා, දිළුම් දිමාලි සිල්වා යුවල, සමන් කුලරත්න, පියත් දිසානායක, කුෂාන් කුලතුංග, වෙනුරි කුලතුංග, සහානා ගනේෂ්, වගේම දර්ශි හස්තනායක සහය වුණා. සනත් ජීවන්ත ප්‍රවේශ පත්‍ර අලෙවියේත් සංගත තැටි අළෙවියේත් වගකීම භාරගත්තා. ඔන්න අපේ කට්ටිය.

මේ කට්ටිය එක්ක විටින් විට අප රැස්වීම් පැවැත්වූවා. ''රනින් ෂීට්'' එකට අනුව කීප වතාවක් විස්තර කතා කළා. අදහස් හුවමාරු කරගෙන සමහර දේවල් එක් කරගත්තා. සමහර දේවල් ඉවත් කළා. සරිනිත් මේ රැස්වීම් වලට අනිවාර්යෙන්ම සහභාගී වුණා. ඒ වගේම වාදක මණ්ඩලයත් එක්ක වාර දෙකක්ම ශබ්දාගාරයක් වෙන් කරවාගෙන පුහුණුවීම් කළා. ඔබ කියන කොටයි මතක් වුණේ සරිනිට අමතරව ගායනයට එක් වුණ පිරිස ගැන.

විශාරද මනීෂ විජේකෝන්, සහිනි ඉළංගරත්න, අශ්විනී දහනායක, මහීෂ ගමගේ, හන්සිකා සඳලි ඩයස් කියන දක්ෂ තරුණ දරු දැරියෝ පස් දෙනාට අමතරව සරිනිගේ සංගීත ගුරුවරිය වන වාසනා වීරකෝන් මහත්මියත් එක යුග ගායනයකට දායක වුණා.

වේදිකා පසුතල නිර්මාණය කරන්න අපි පටන් ගත්තේ මාස ගණනකට කලින්, ''සිනාවී'' නමටත්, තාරුණයටත් ගැලපෙන ඉත සරළ නිර්මාණාත්මක පළක හතරක් වාදක මණ්ඩලය ඉදිරියෙන් තියන්නට නිර්මාණය කළා. ඒ නිර්මාණයට තිත් එක්ක සරළ රේඛායි යොදාගත්තෙ. කම්පනය වෙන ''සරසුලක්'' වැනි දෙයකින් බිහිවෙන නාදයකින් පිටවෙන තිත් වලින් සිනා, බුබුලු දක්වන්නයි අදහස් කළේ. කම්පනය වන ''සරසුල'' කියන්නේ විද්‍යාවේ ධ්වනිය ගැන පරීක්ෂණ කරන්න යොදාගන්න උපකරණයක. විද්‍යව සරිනිට සම්බන්ධයි.

වාද්‍ය භාණ්ඩයකින් පිට වන ස්වර විදියටත් මේ මෝස්තරය පෙනෙනවා. හරියට මොකක්දෝ සංගීත රීතියකට ලියපු ස්වර සටහනක් වගේ. මේ පළක අතර විශාල බඳුන් තැබුවේ ඒ නැංවෙන සිනා හඬ හරි සංගීත හඬ හරි රැස් කරගැනීමට සැරසී සිටින රසික කැළ සංකේතවත් කරන්නට.

සරිනිට සරස්වතී ගීතයට ඒකාත්මික වෙන්න පිළියෙල කරපු පීඨිකාව මේ පළක හතර ඉදිරියෙන් තිබ්බා වේදිකාවේ හරි මැද්දට වෙන්න. මේ පීඨිකාවටත් අර පළක වල සැරසිල්ලේ විදියටම කම්පනය වන සිරස් සරළ රේඛා දෙකකුයි එයින් බිහි වෙන නාදය දැනවීමට තිතකුයි එකතු කළා. සරළ බව පෙන්වන්නට සරල රේධා, තිත් වාගේ ජ්‍යාමිතක රූප යොදාගන්නේ සරිනිගේ වෘත්තිමය පසුබිමටත් ගැලපෙන්න.

වේදිකා සැරසිලි වල සමමිතික බව බිඳින්නට එක පැත්තක කලියුගයේ පොත් රාක්කයකුත් ඒ මත මේස ලාම්පුවකුත් පසෙකින් තැබෑරුම් කනප්පුවකුත් (බාරර් ස්ටූල්) තිව්වා. වාදකයින් අසුන් ගන්නා පුටු, කනප්පු වගේම පීඨිකාවල් හැම දෙයක්ම සැරසුනේ කළු, සුදු සහ ''නිකල්'' පාටින්. මේ දේවල් තැම්පත් කෙරුණේ සුපු පාට පොළවක මතුපිටක. වාදකයින් සින ප්‍රදේශයත් ගායිකාවන්ගේ පීඨිකාවත් සුදු අතුරනයෙන් සම්බන්දධ කළේ පවිත්‍රත්වයත්, නැවුම් බවත් ගායනයටත් වාදනයටත් යා කරවන අදහසින්. සුදු පිරුවට මතයි මේ කුළුඳුල් සංගත තැටි එළිදැක්මත්, සරිනයගේ දොරට වැඩුමත් සිදු කරන්නට අදහස් කළ්.

මුල්ම ගායනය සරස්වතී දේවී අභිනන්දනයක්. හීන්දෝලි රාගය මුල් කරගෙන වාසනා වීරකෝන් සංගීත ගුරුවරිය නිර්මාණය කළ ගීය සරිනි ගයන්නේ උත්තර භාරතීය ඇඳුමකින් සැරසීගෙන. ගායනයේ ''ආලප්'' කොටස ගැයුමට පෙරයි වේදිකා තිරය විවර වෙන්නේ. ආලාපය සමගින්ම තිරය විවර වෙලා අවසන්. ඊට පස්සේ වාදනය වෙන තබ්ලා වේ වේකාවටයි නැටුම් කණ්ඩායම නටමින් වේදිකාවට එන්නේ. ගායනය අවසානයේ කණ්ඩායමත් සමගම ඇය වේදිකාව පිටිපසට යන්නේ රසිකයින්ට ආචාර කිරීමෙන් පසුවයි.

සිරිනියගේ කුඩා කාලයේ කළ ගායනා පටිගත කරගත් කොටස් ඇතුළත් කරමින් කළ නව නිර්මාණය තිරයේ දිග යැරෙන්නේ කුඩා කාලයේ මෙන්ම වර්තමානයේ ඡායාරූප හා දර්ශන සමගින්. මේ කාලයේදී ගායිකාවකට ළමා සාරියක් ඇඳගැනීමටයි මුල් පිටපතේ හැටියට නියමිතව තිබුණේ. එය ඇ ප්‍රතික්ෂේප කළේ කෙටි කලකින් එවැන්නක් කිරීම අපහසු බැවින්. පිටපතේ එලෙස ලියූයේ ඉන් අනතුරුව ඇය සිය ගුරුවරිය හා ගයන ''නෙරිය තියන්නේ'' ගීයට ගැලපීමටයි. මෙලෙස ගී කීපයක් ගැයුමෙන් අනතුරුව නැවත ඇය අනිත් තරුණ ගායක ගායිකාවන්ට වේදිකාව භාර දී පසුපසට යන්නේ තවත් වෙනසකට.

පූර්විකාව තිරයේ ප්‍රදර්ශනය වීමත් සමග ගායිකාව තමන්ගේ පියා වන ගීත රචකයා සමග වේදිකාවට එනනේ තම්මැට්ටම් සුරලක් එක්ක බෙර පදයක් වැයෙන අතර සංගත තැටිය පිළිගැන්වීම මුලීම පූජ්‍ය පක්ෂයටත් ඉන් පසුව මවටත් පිදීමෙන් ඇරඹෙනවා. මවට පිදෙන සංගත තැටිය පියාගේ ගීත රචනා ඇතුලත් තිළිණයක් විදියටය සරිනිට මුලින්ම පියා පිළිගත්වන්නේ. ආචාර සමාචාර කර ලබාගත් ඒ සංගත තැටියයි ඇය මවට පිළිගන්වන්නේ. සංගත තැටි පිළිගැන්වීමෙන් අනතුරුව කෙටි පිළිසඳරක නිවේදක යුවල සමග යෙදෙන ඇය කවි ගයනයක් කිරීමට සැරසෙනවා. කුඩා කල ඇය කියවූ ''කුමාරොදය'' පොත පියා ඇයට පිළිගන්වන්නේ ඇයට පුදුමය දනවමින්. එයින් ''සුදෝසුදු'' කවි පෙළේ කවියක් කියවමින්. කවි ගයා අනතුරුව ඇය අනෙකුත් ගායනාවන්ට එක් වෙනවා. ''දළදා තේවාවේ'' ගීයට බෙර වාදනද ඇතුලත්. අම්මිරෝ ගීයට නර්තනය විශ්ව රංගායතනයෙන්.

විවේකයෙන් පසුව ඇය වේදිකාවට එන්නේ බටහිර පන්නයේ ගවුමකින් සැරසීගෙන. විශාරද නන්දා මාලනිය ගැයූ ''මේඝයක් සේ'' සහ නිරෝෂා විරාජිනියගේ ''රෑ දොළොස් පැයේ'' ගී සමග තමන්ගේ ස්වතන්ත්‍ර ගීය වුණ ''සිනා සිනාවී'' ගීය ගයන්නේ යම් කිසි රංගනීය බවකුත් පෙන්වමින්. මේ ගීය සඳහා ඩ්‍රම්ස් වාද්‍ය කට්ටලය වැයීමට ජූඩ් ප්‍රනාන්දු ශිල්පියාගේ යොමුන් පුතණුවන් වන ප්‍රවීන් ප්‍රනාන්දු එක් වීම ද විශේෂත්වයක්. ඔහුත් හැබෑම දක්ෂයෙක්. ''රෑ දෙළොස් පැයේ'' ගීයට නර්තනය ඉදිරිපත් කරන්නේ ''අභින'' නර්තන කණ්ඩායම ''සිනාවී'' ගීයටද ''අභින'' නර්තන කණ්ඩායමේ ඒකමිතික තීරණය වුණා.

''ඉන්ද්‍රජිත් මිරිහාන සංගීතවේදියා සංගීතවත් කළ ''ගුගල් ගුලාවේ'' ගීය සඳහා පිටපතක් ලියා රූප රචනය අධ්‍යක්ෂණය කළේ ලංකාවේ සම්මානනීය අධ්‍යක්ෂකවරයෙකු හා සංස්කාරකවරයෙකු වන රුක්මල් නිරෝෂ් ප්‍රවීණයායි. එහි රඟපෑමට සරිනි හා එක් නුයේ තරිඳු කාලංගමුදලි මෙල්බන් යෞවනයයි.

''උත්තර භාරතීය රාගධාරී සංගීතයට අනුව මුලින් ම මියැසියට ඒකාත්මික වන ප්‍රේක්ෂකාගාරය අවසානයේ බටහිර ජෑස් සංගීතයට නැටවෙන තත්වය දක්වා ගෙන එන මේ මියැසි පෙළගැස්ම ''සිනාවී'' සංගත තැටියේ පෙළගැස්මට අනුකූලව කළ දෙයක්. සංගත තැටියේ මෙන්ම ප්‍රසංගයේත් ගායනීය පූර්විකාව ලෙස යොදාගන්නේ සහන් රංවලයන් නිර්මාණය කළ තනුවකට අනුව ලියූ ''කං කං බූරූ'' ගීතය. එය ඇත්තෙන්ම ගීයකුත් නොවන, නොවන්නේත් නොවන නව නිර්මාණයක්. සිනි බහ තෝරන වියේ පටන් ගැයූ ගීථ කොටස් පියවර කීපයකින් මේ ගීයට මුහුවෙන්නේ සැහැල්ලක සවිඳමක රටාවට. මේ පටිගත කිරීම් ගීය සඳහා සකස් කරදීමෙන් වාගේම ''ගුගල් ගුලාවේ'' ගීයට අවශ්‍ය නිවාස පහසුකම් ලබා දීමෙන් ප්‍රියන්ත ප්‍රනාන්දු හා සමන්මලී යුවල දුන් සහය අගය කරන්න ඕන. මේ ගීයට රූප රචනය කළ චන්දිම ජයනෙත්ති සොයුරා සරිනිගේ කුඩා කල පින්තූර ඇතුලත් කිරීමට අමතක කළේ නෑ.''

''මේ ආකාරයට කාගේත් සහයේගයෙන් වැඩි දියුණු වී ඉදිරිපත් කළ ප්‍රසංගය වෙනුවෙන් ප්‍රචාරය ලබා දුන්නා. සියළු මාධ්‍ය, ප්‍රවේශ පත් අලෙවි කර දුන් සියළු අය වගේම වෙළඳ සැල්, වෙබ් අඩවි අපි මේ වෙලාවේ සිහිපත් කරනවා. ඒ වගේ ම කෑම බීම සපයලා දුන්න ප්‍රවාහන කටයුතු කරලා දුන්න අයවත් තවත් ආකාරවලින් උදව් දුන්න හැමෝවමත් මතක් කරනවා ස්තුති පූර්වකව.''

''ප්‍රේක්ෂකාගාරය පිරිලා ඉතිරෙන්න එක්වෙලා ප්‍රසංගය විඳලා අපට ධෛර්ය දෙන්න, ආශිර්වාද කරන් ආව හැමෝටමත් ස්තුතිවන්ත වෙනවා.

පන්හිඳ තමන් පටිගත කරගත්ත කතාව ''සන්සන'' පත්තරේට යවන් සූදානම් කළා.